din-10-22-uns-328P-30x3-pnf

ලංසු සඳහා ආරාධනාව (IFB)

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

(විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය)

රත්නපුර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සංක්‍රමණික සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිලි සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු

1. බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 234 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙනුවෙන් දෙපාර්තමේන්තු මිලදී ගැනීමේ කමිටුවේ සභාපතිවරයා විසින්, පහත දැක්වෙන පරිදි සහ ශ්‍රී ලංකා රුපියල් මිලියන 46.0 ක් (මූලික පිරිවැය) ලෙස ඇස්තමේන්තු කර ඇති රත්නපුර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සංක්‍රමණික සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිලි සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සඳහා සුදුසුකම් ලත් සහ නියමිත සුදුසුකම් සපිරූ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

   වැඩබිම (Site) පිහිටා ඇත්තේ රත්නපුර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සංක්‍රමණික සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිලි සංකීර්ණ පරිශ්‍රයේය.

   කඩා බිඳ දැමීමේ කටයුතු, පින්තාරු කිරීමේ කටයුතු, ඇලුමිනියම් කටයුතු,ජලනල හා සනීපාරක්ෂක ස්ථාපන කටයුතු, බිම් සහ බිත්ති තිම කිරීමේ කටයුතු, විදුලි කටයුතු ආදී වැඩ කටයුතු සිදු කිරීමට නියමිතය. ගිවිසුම් කාලය දින 120 කි.

2. ලංසු තැබීම ජාතික තරගකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටිය හරහා සිදු කෙරේ.

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට නම්, සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොකළ අයෙකු විය යුතු අතර, පහත අවශ්‍යතා සපුරාලිය යුතුය.

   (අ) අවශ්‍ය වන CIDA ලියාපදිංචිය:

   විශේෂඥතාව: ගොඩනැගිලි ඉදිකිරීම්

   ශ්‍රේණිය: C6, C5 සහ C4

4. ඉහත වගුවේ වැඩ කටයුතු සඳහා සඳහන් කර ඇති CIDA ලියාපදිංචි කිරීමේ ක්‍රමය යටතේ අදාළ ශ්‍රේණිය සහ ලියාපදිංචි ක්ෂේත්‍රය ඇති සහ කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 5 ඉක්මවන අවස්ථාවන්හිදී 1987 අංක 3 දරන ප්‍රසිද්ධ කොන්ත්‍රාත් පනතේ විධිවිධාන යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති ලංසුකරුවන් පමණක් ලංසු තැබීමට සුදුසුකම් ලබයි. මහජන මූල්‍ය චක්‍රලේඛවල සහ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද වෙනත් ඕනෑම චක්‍රලේඛයක දක්වා ඇති කොන්දේසි ද ඇගයීම සඳහා අදාළ වේ.

5. ලංසුකරුවන් විසින් නිසි ලෙස පූරවන ලද, අත්සන් කරන ලද සහ නොතාරිස් කරන ලද එකඟතා විරෝධී ප්‍රකාශයක් (Non-Collusion Affidavit) තම ලංසුවේ කොටසක් ලෙස ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී එකඟතා විරෝධී ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ලංසුව ප්‍රතිචාර නොදක්වන ලංසුවක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන අතර, වැඩදුර ඇගයීම්වලින් ඉවත් කරනු ලැබේ.

6. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම්වලට ඇතුළත් වන්නේ:

   (අ) වැඩබිමේ (Site) සිටිය යුතු තාක්ෂණික කාර්ය මණ්ඩලය:

   1. වසර 3 ක පළපුරුද්ද සහිත සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ BSc උපාධියක් ඇති එක් (01) ඉංජිනේරුවරයෙක්.
   2. වසර 5 ක පළපුරුද්ද සහිත සිවිල් විෂය සඳහා NCT සුදුසුකම් ඇති එක් (01) වැඩ තිරීක්ෂකයෙක්.

7. ඔබට වැඩදුර තොරතුරු බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 234 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ, 2 වන මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශයෙන්, දුරකථන අංක 011-2880500 මඟින් ලබාගත හැකි අතර, පහත සඳහන් ලිපිනයෙන් ලංසු ලේඛන පෙ.ව. 09.00 සිට ප.ව. 15.00 දක්වා කාලය තුළ පරීක්ෂා කළ හැක.

8. ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් රුපියල් 11,600.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, 2026/10/23 දින සිට 2026/11/16 දින දක්වා පෙ.ව. 09.00 සිට ප.ව. 15.00 දක්වා කාලය තුළ බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 234 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති වෙත ලිඛිත අයැදුම්පතක් ඉදිරිපත් කිරීම මඟින් ඔබට මිලදී ගත හැක.

9. ලංසු පූර්ව රැස්වීම 2026/11/02 දින පෙ.ව. 11.00 ට රත්නපුර, නව නගරය, විද්‍යාල මාවත, අංක 89/6 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේදී පැවැත්වේ. ලංසු පූර්ව රැස්වීමට සහභාගී වීම අනිවාර්ය වේ. ලංසු පූර්ව රැස්වීමට සහභාගී වීමට නොහැකි වූ ලංසුකරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. මුද්‍රා තැබූ ලංසු 2026/11/17 දින හෝ එදිනට පෙර පෙ.ව. 10.00 ට පෙර පහත ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රසම්පාදන අංශයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලබන අතර, ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු වසා දැමීමෙන් පසු ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

11. සියලුම ලංසු සමඟ ශ්‍රී ලංකා රුපියල් හාරලක්ෂ හැට දහසක (රු. 460,000.00) ලංසු සුරක්ෂිතතාවක් ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂිතතාව ලංසු වසා දමන දින සිට දින 119 ක් දක්වා වලංගු විය යුතුය. ලංසු දින 91 ක් දක්වා වලංගු විය යුතුය.

12. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිතුමාට කිසිදු ප්‍රශ්න කිරීමකින් තොරව සියලුම හෝ ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමට හෝ ලංසුවක කොටසක් පමණක් පිළිගැනීමට අයිතිය ඇත.

13. ඉහත සඳහන් කරන ලද ලිපිනය වන්නේ:

සභාපති, දෙපාර්තමේන්තු මිලදී ගැනීමේ කමිටුව, ප්‍රසම්පාදන අංශය, 2 වන මහල,
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.
දුරකථන අංකය: 011-2887585